කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය

---

01. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 22 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 04 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත සහ පූර්ව වර්ෂවලදී ඉටුකර තිබුණු ව්‍යාපෘති 12 ක් සඳහා 2019 දෙසැම්බර් 31 දිනට ගෙවීමට තිබුණු රු.14,549,372 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | සියළු ණයහිමියන් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සැලසිය යුතු වේ. | 2019.12.31 දිනට ගෙවීමට තිබූ රු.14,549,372 ක වටිනාකම ණය හිමියන් ලෙස අවසන් ගිණුමේ පිටු අංක 61 හි ඇතුළත් කර ඇතත් ගිණුම්ගත කර නැත. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළදී රු.8,616,247 ක් වැයකල ඉදිකිරීම් 06 ක් ප්‍රාග්ධනගත කර නොතිබුණි. | සියළු වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුවේ. | පිළිගනිමි. 2020 වර්ෂයේ ගිණුමට ඇතුළත් කරමි. |
| (iii) | වානිජ ගොඩනැගිලි නවීකරණය වෙනුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබුණු රු.4,199,054 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සියළු වගකීම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. | පිළිගනිමි. 2020 වර්ෂයේ ගිණුමට ඇතුළත් කරමි. |

(ආ) ලැබිය යුතු ගිණුම්

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2004 සිට 2018 වර්ෂය දක්වා අය නොවෙමින් පවතින රු.567,022 ක් වූ හිඟ බදුකුලී වටිනාකම අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | මෙම වර්ෂයේදී අදාළ හිඟ බදු මුදල් අයකර ගැනිමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

-------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.92,248,685 ක් වූ ඉඩම් ගොඩනැගිලිවලට අදාලව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිගනිමි. ඉඩම් වලට අදාළ හිමිකම් පවරා ගැනීම සඳහා කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

------------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1951 අංක 14 දරන මෝටර් වාහන පනත 203 අධිකාරිය | සභාව සතු අත්ට්‍රැක්ටරයක් හා ට්‍රේලරය, රෝද 04 ට්‍රැක්ටරයක් හා ට්‍රේලරය ලියාපදිංචි නොකරමින් ධාවනයේ යොදා තිබුණි. | ලියාපදිංචි කිරීම් සිදුකර ගැනීමට කටයුතු කළයුතු වේ. | අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරය ලියාපදිංචි නොකර ඇති බව පිළිගනිමි. ලියාපදිංචි කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2006 නොවැම්බර් 14 දිනැති අංක PL/07/01/53 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ අංක 09 | සුසාන භූමි ලේඛන නඩත්තු, කිරීම ප්‍රකාශයට පත්කිරීම හා තාප්ප වැටවල් යොදා ආරක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | ලේඛන පිළියෙල කොට පවත්වාගෙන යායුතු වේ. | පිළිගනිමි. බල ප්‍රදේශයේ පවතින සුසාන භූමි සභාව වෙත පවරා දෙන ලෙසට ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීමක් කර ඇත. එම සුසාන භූමි පවරාදීමෙන් පසු උපදෙස් පරිදි කටයුතු කරමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,645,382 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,355,178 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම් , රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 1,792,112 | 1,851,169 | 1,606,483 | 1,626,044 | 1,722,112 | 1,856,994 | 1,442,851 | 1,381,358 |
| (ii) | කුලී | 8,475,463 | 9,682,150 | 9,493,608 | 1,452,929 | 8,696,221 | 7,011,975 | 7,240,204 | 1,264,387 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 4,322,500 | 3,764,488 | 4,041,269 | - | 3,802,500 | 2,816,330 | 2,816,330 | 276,781 |
| (iv) | වෙනත් ආදායම | 8,323,936 | 7,914,915 | 7,813,647 | 4, 124,684 | 9,230,500 | 5,092,868 | 3,092,852 | 4,023,416 |
| | | 22,914,011 | 23,212,722 | 22,955,007 | 7,203,657 | 23,451,333 | 16,778,167 | 14,592,237 | 6,945,942 |

#### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව දියුණුකල ප්‍රදේශ ගැසට් නොකර වරිපනම් අයකිරීම සිදුකර තිබුණු අතර මෙම නිසා හිඟව පවතින රු.1,626,094 ක වරිපනම් බදු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | දියුණු කළ ප්‍රදේශ ගැසට් කර රීති ප්‍රකාරව හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියට ගෙනා ආ හිඟයෙන් 2019 වර්ෂයේ රීති ප්‍රකාරව කටයුතු කරමින් රු.292,611 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කරන ලදි. තවදුරටත් ඉදිරියට පවතින හිඟය මෙම වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | කහටගස්දිගිලිය නගරයේ පිහිටි සභාවට අයත් කඩකාමර 13 ක බදුකරුවන්ගෙන් කසළ බදු අයකර නොතිබුණි. | කසල බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි<br>අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.3 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 59-66 ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් සිදුකර ව්‍යාපාරික ස්ථාන ලේඛනගත කර නොතිබුණි. | රීති ප්‍රකාර ලේඛනයන් පවත්වාගෙන යා යුතු වේ. | පිළිගනිමි. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.745,669 ක් හා මුද්දර ගාස්තු රු.1,789,337 ක් විය. | අදාල හිඟ ආදායම් නිරවුල් කර අයකර ගත යුතු වේ. | පිළිගනිමි.<br>මෙම මුදල් 2020 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට අදාළ කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළයුතු වේ. | ගරු අමාත්‍යවරයා විසින් සාදන ලදුව 1952 අංක 06 සඳහන් සම්මත අතුරු ව්‍යවස්ථාව හා 2016.03.30 දින අංක 1960/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද උතුරු මැද පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා 10 වැලඳ ගෙන ඇත. |

(ආ) අත්හැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විශේෂ අවශ්‍යතා ඇති ගම්මාන සංවර්ධන 2019 යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණු ඇස්තමේන්තුගත වටිනාකම රු.500,000 ක් වූ රත්මල්ගහ වැව පාර කුට්ටිගල් ඇතිරීම ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම හා අදාළ ව්‍යාපෘතිය ඉටුකිරීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි.<br>i. අදාල සංවිධානය අසාධූ ලේඛන ලේඛන ගත කිරීමට කටයුතු කරමි.<br><br>ii. මෙම මාර්ගයේ කොටසක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සිදුකිරීමට නියමිතව තිබීම නිසා අප විසින් ගිවිසගත් ව්‍යාපෘතිය ඉදිකිරීමට නොහැකි විය. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතු වේ. | පිළිගනිමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මස්කඩ, මාළු ලැලි හා රථගාල් බදුදීම මත 2004 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අයවිය යුතු හිඟ රු.1,452,928 ක් අයකර ගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර හිඟ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. හිඟ මුදල් මෙම වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

3.3 වාහන උපයෝජනය

---------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ------------- | ------------------------------- |
| (අ) | සභාව සතු රු.5,593,818 ක් වටිනා වාහන 06 ක් හා වටිනාකම හඳුනාගත නොහැකි ජල බවුසර් ට්‍රේලරයක් ධාවනයට නොගෙන සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | අදාල වාහන අළුත්වැඩියා කර ධාවන කිරීම සඳහා කටයුතු කළයුතු වේ. | සභාවේ එදිනෙදා රාජකාරි කටයුතු සඳහා යොදාගන්නා වාහන අලුත්වැඩියා කරමින් ධාවනයේ යොදවනු ලබයි. මෙම වර්ෂයේදී සභා අරමුදල යොදවා වාහන කිහිපයක් හෝ අලුත්වැඩියා කිරීමට කටයුතු කරමි. |
| (ආ) | දැනට ධාවනය වන වාහන 05 ක් සඳහා රක්ෂණාවරණ ලබාගෙන නොතිබුණි. | රක්ෂණාවරණ ලබා ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. රක්ෂණ ආවරණ මෙම වර්ෂයේදී ලබාගැනීමට කටයුතු කරමි. |